# නිෂ්පාදන ගිණුම්

භාණ්ඩ නිෂ්පාදනය කරන ව්‍යාපාරයක කිසියම් කාලපරිච්ඡේදයක් තුල නිපදවූ භාණ්ඩ වල **"නිෂ්පාදනය කරන ලද භාණ්ඩවල පිරිවැය"** හෙවත් **"නිෂ්පාදන පිරිවැය"** ගණනය කිරීම සඳහා සකස් කරන ප්‍රකාශය නිෂ්පාදන ගිණුමක් ය. මෙය සාමාන්‍ය ආදායම් ප්‍රකාශයේ ම කොටසක් ලෙස පිළියෙල කෙරේ.

**නිෂ්පාදන පිරිවැය පහත පරිදි වර්ග කර දැක්විය හැකිය**




**නිෂ්පාදනයට අදාලව සෘජුව ම හඳුනාගත හැකි වියදම්, එනම් නිෂ්පාදනයත් සමග පැහැදිලිව වෙන්කර හඳුනාගත හැකි වියදම් සෘජු පිරිවැයයි. මෙය ප්‍රධාන කොටස් 3 කට වෙන්කල හැකිය.**

**1 සෘජු ද්‍රව්‍ය පිරිවැය**

කිසියම් නිෂ්පාදනයකට යොදා ගනු ලබන ප්‍රධාන අමු ද්‍රව්‍යයක්, සෑම නිෂ්පාදනයකටම සමානව යොදනු ලබන අමුද්‍රව්‍යයක් සෘජු පිරිවැය වේ.

උදා : කමිස නිෂ්පාදනයේ දී රෙදි පිරිවැය

**2 සෘජු ශ්‍රම පිරිවැය**

නිෂ්පාදන කටයුත්තට සෘජුවම දායක වන ශ්‍රමික්යන්ට ගෙවන වැටුප හා දීමනා සෘජු ශ්‍රම පිරිවැයයි.

උදා : කමිස නිෂ්පාදනයේ දී ඇඟලුම් සේවිකාවන්ගේ වැටුප් පිරිවැය

**3 සෘජු වෙනත් වියදම්**

සෘජු ද්‍රව්‍ය හෝ සෘජු ශ්‍රමය නොවන අනෙකුත් සෘජු වියදම් එනම් නිෂ්පාදන ඒකකයක් සමඟ වෙන්කර හඳුනාගත හැකි අනෙකුත් සෘජු වියදම් වෙනත් සෘජු ව්වියදම් නම් වේ.

උදා : පුරස්කාර වියදම්

**නිෂ්පාදන ඒකකයක් සමඟ සෘජුවම හඳුනාගත නොඇකි අනෙකුත් වක්‍ර වියදම්, නිෂ්පාදන පොදුකාර්ය ලෙස සැලකේ. මෙම වක්‍ර නිෂ්පාදන පිරිවැය පහත පරිදි වර්ග කළ හැකිය.**

**1 වක්‍ර ද්‍රව්‍ය පිරිවැය**

නිෂ්පාදන කටයුත්තකදී යොදනු ලබන නමුත් අවසාන නිෂ්පාදිතයේ කොටසක් බවට පත් නොවන අනිකුත් ද්‍රව්‍ය වක්‍ර ද්‍රව්‍ය පිරිවැය නම් වේ.

උදා : උළු නිපදවන කම්හලක පුළුස්සන දර

**2 වක්‍ර ශ්‍රම පිරිවැය**

නිෂ්පාදන කටයුත්තට සෘජුවම දායක නොවන අනිකුත් ශ්‍රමිකයන්ට ගෙවන වැටුප් හා දීමනා වක්‍ර ශ්‍රම පිරිවැයයි.

උදා : සුපරීක්ෂක වැටුප්

**3 වක්‍ර වෙනත් වියදම්**

ද්‍රව්‍ය හා ශ්‍රමය නොවන අනෙකුත් වක්‍ර වියදම් වක්‍ර වෙනත් වියදම් ය.

උදා : විදුලිය, යන්ත්‍ර ක්ෂය

**1 පරිභෝජනය කළ ද්‍රව්‍ය පිරිවැය**

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය - | ආරම්භක තොගය | X |
| | ගැනුම් | X |
| | ආපසු යැවුම් | (X) |
| | ගෙන ඒමේ කුලී | X |
| නිෂ්පාදනයට ඇති ද්‍රව්‍ය | | X |
| | අවසන් තොගය | (X) |
| පරිභෝජනය කළ ද්‍රව්‍ය පිරිවැය | | X |

**2 ප්‍රාථමික පිරිවැය**

| | |
|---|---|
| පරිභෝජනය කළ ද්‍රව්‍ය පිරිවැය | X |
| සෘජු ශ්‍රම පිරිවැය | X |
| සෘජු වෙනත් පිරිවැය | X |
| ප්‍රාථමික පිරිවැය | X |

**3 නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය**

| | |
|---|---|
| වක්‍ර ද්‍රව්‍ය වියදම් | X |
| වක්‍ර ශ්‍රම පිරිවැය | X |
| වක්‍ර වෙනත් පිරිවැය | X |
| නිෂ්පාදිත පොදුකාර්ය | X |

**4 නිෂ්පාදන පිරිවැය**

| | |
|---|---|
| ප්‍රාථමික පිරිවැය | X |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | X |
| නිෂ්පාදන පිරිවැය | X |

**නොනිමි භාණ්ඩ ගැලපීම**

| |
|---|
| භාණ්ඩ නිෂ්පාදන කටයුත්තේ අතර මැද අවස්ථාවේ ඇති අර්ධ නිමි භාණ්ඩ නොනිමි ලෙස සැලකේ. |
| **නොනිමි ආරම්භක තොගය පහත පරිදි ගැලපිය හැකිය** |
| නිෂ්පාදන ගිණුම හර |
| ආරම්භක නොනිමි තොග ගිණුම බැර |
| **නොනිමි අවසන් තොගය පහත පරිදි ගැලපිය හැකිය** |
| අවසන් නොනිමි තොග ගිණුම හර |
| නිෂ්පාදන ගිණුම බැර |

- ඉහත පරිදි නොනිමි ගැලපීම ප්‍රාථමික පිරිවැයට හෝ කම්හල් පිරිවැයට සිදුකල හැකිය

**කම්හල් නිමි භාන්ඩ ගැලපීම**

| |
|---|
| භාණ්ඩ නිෂ්පාදනය අවසන් වුවත් කම්හලෙන් විකුණුම් අංශයට මාරු නොකර කම්හලේ ඉතිරිව ඇති භාණ්ඩ කම්හලේ නිමි භාණ්ඩ ලෙස සැලකේ. |
| **කම්හල් නිමි ආරම්භක තොගය පහත පරිදි ගැලපිය හැකිය** |
| නිෂ්පාදන ගිණුම හර |
| කම්හල් නිමි ආරම්භක තොග ගිණුම බැර |
| **කම්හල් නිමි අවසන් තොගය පහත පරිදි ගැලපිය හැකිය** |
| කම්හල් නිමි අවසන් තොග ගිණුම හර |
| නිෂ්පාදන ගිණුම බැර |

❖ මෙම කම්හල් නිමි භාණ්ඩ ගැලපීම කම්හල් පිරිවැයට සිදුකල යුතු ය.

**නිෂ්පාදන පිරිවැය වෙළඳ ගිණුමට මාරු කිරීම**

නිෂ්පාදන ගිණුමෙන්, නිෂ්පාදන පිරිවැය ගණනය කල පසු භාණ්ඩ විකුණනු ලබයි නම්, එම භාණ්ඩවල විකුණුම් පිරිවැය ගණනය කිරීමට වෙළඳ ගිණුමට මාරු කල යුතු ය. එය පහත පරිදි සිදුකල යුතු ය.

| | |
|---|---|
| වෙළඳ ගිණුම | හර |
| නිෂ්පාදන ගිණුම | බැර |

**Advanced Level 1993**

(අ) නිෂ්පාදන ආයතනයක් සම්බන්ධයෙන් ‘‘ඍජු වියදම්’’ හා ‘‘වක්‍ර වියදම්’’ යන පද ලුහුඩින් පැහැදිලි කර පහත වියදම් ඍජු වියදම් හෝ වක්‍ර වියදම් දැයි දක්වන්න.
(පිළිතුරු ලිවීමේ දී වියදමට අදාළ අංකය පැහැදිලිව ලියා ඉදිරියෙන් පිළිතුරු ලිවීම ප්‍රමාණවත් වේ)

| **ආයතනය** | **වියදම** | **ඍජු ද/වක්‍ර ද** |
|---|---|---|
| බේකරිය | පාන් පුළුස්සන්නගේ වැටුප | ……………………………. |
| | පොත් තබන්නාගේ වේතනය | ……………………………. |
| | පාන්පිටි | ……………………………. |
| | බේකරි ගොඩනැගිල්ලේ ක්ෂය | ……………………………. |

| **ආයතනය** | **වියදම** | **ඍජු ද/වක්‍ර ද** |
|---|---|---|
| ඇඟලුම් කම්හල | රෙදි | ……………………………. |
| | මහන මැෂින් නඩත්තු | ……………………………. |
| | මහන මැෂින් ක්‍රියාකරවන්නියගේ වේතනය | ……………………………. |
| | කම්හලේ වරිපනම් | ……………………………. |

(ආ) සුමිත් ව්‍යාපාරිකයන්ගේ පොත්වලින් පහත සඳහන් ශේෂයන් 1993 මාර්තු 31 දිනට උපුටා ගන්නා ලදි.

| | | | |
|---|---|---|---|
| | | | රු. |
| අමුද්‍රව්‍ය මිලදී ගැනුම් | | | 158 000 |
| ගෙන ඒමේ කුලී | | | 5 500 |
| 1992/04/01 දිනට තොගය | | | |
| | අමුද්‍රව්‍ය පිරිවැයට | | 35 000 |
| | නොනිමි භාණ්ඩ ප්‍රාථමික පිරිවැයට | | 21 000 |
| කම්හල් ගොඩනැගිලි අලුත්වැඩියා | | | 21 500 |
| කම්හල් පොදු වියදම් | | | 6 200 |
| කාර්යාල වියදම් | | | 16 000 |
| වරිපනම් හා රක්ෂණ (කම්හල) | | | 4 200 |
| වැටුප් | | වක්‍ර | 75 000 |
| | | සෘජු | 122 500 |
| අනෙකුත් සෘජු වියදම් | | | 16 000 |
| කම්හල් කළමණාකරු වේතන | | | 85 000 |
| සුපරීක්ෂක වේතන (කම්හල) | | | 133 000 |
| යන්ත්‍ර රක්ෂණ | | | 6 200 |
| 1992/04/01 දිනට මෙවලම් | | | 6 400 |

**අනෙකුත් තොරතුරු**

| | |
|---|---|
| 1993/03/31 දිනට තොග | |
| අමුද්‍රව්‍ය පිරිවැයට | 38 500 |
| නොනිමි භාණ්ඩ ප්‍රාථමික පිරිවැයට | 20 100 |
| මෙවලම් | 2 400 |

1993/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ගිණුම පිළියෙල කරන්න.

## Advanced Level 1997

(අ) නිෂ්පාදන ගිණුමක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කරන්න.

(ආ) 1997 මාර්තු 31 දින සීමිත උළු නිපදවන්නෝ සහ සමාගමේ පොත් වලින් පහත සඳහන් ශේෂ ලැයිස්තුව උපුටාගන්නා ලදි.

| | රු. |
|---|---|
| 1996 අප්‍රේල් 01 දිනට තොගය | |
| අමුද්‍රව්‍ය | 7 800 |
| නොනිමි භාණ්ඩ | 1 100 |
| නිමි භාණ්ඩ | 20 000 |
| අමුද්‍රව්‍ය ගැනුම් | 180 500 |
| අමුද්‍රව්‍ය ආපසු යැවුම් | 2 000 |
| සෘජු කම්හල් වැටුප් | 60 400 |
| වේතන පරිපාලන හා සුපරීක්ෂක | 24 000 |
| ස්වාධිකාර හිමියන්ට ගෙවූ බලපත්‍ර ගාස්තු | 10 500 |
| කම්හල් විදුලි බලය | 8 000 |
| කම්හල් පොදු වියදම් | 6 000 |
| යන්ත්‍ර ක්ෂය | 8 000 |
| 1997 මාර්තු 31 දිනට තොගය | |
| අමුද්‍රව්‍ය | 9 700 |
| වැඩ නොනිමි භාණ්ඩ | 1 600 |
| නිමි භාණ්ඩ | ? |
| විකුණුම් | 275 000 |

**අතිරේක තොරතුරු**

1 වේතන වලින් තුනෙන් දෙකක් නිෂ්පාදන ලෙස සැලකිය යුතු ය.

2 1996 අප්‍රේල් 01 දිනට නිමි භාණ්ඩ තොගයේ උළු කැට 8 000 ක් ඇතුළත් වුණි. මේවා වර්ෂය තුළ විකුණා ඇත. මේ වර්ෂය තුළ දී නිෂ්පාදනය කොට ඇත්තේ උළු කැට 95 000 කි. වර්ෂය තුළ විකුණු උළු කැට 85 000 කි.

3 බලපත්‍ර ගාස්තු සෘජු වියදම් ලෙස සැලකිය යුතු ය.

**ඔබ කළ යුතු දෑ**

1 1997 මාර්තු 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා නිෂ්පාදන ගිණුම පිළියෙල කරන්න.

2 උළු කැටයක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

3 වර්ෂය අවසානයේ දී නිමි භාණ්ඩ තොගයේ වටිනාකම ගණනය කරන්න.

4 1997 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා වෙළෙඳ ගිණුම සකස් කරන්න.

**Advanced Level 1999**

ගඩොල් නිපදවන්නෙකු වූ සීමාසහිත ඉසුරු සමාගමේ 1998 වර්ෂයේ ගිණුම් වලින් පහත සඳහන් තොරතුරු උපුටා ගන්නා ලදි.

| | 1998 ජනවාරි 01 | 1998 දෙසැම්බර් 31 |
|---|---|---|
| | රු. | රු. |
| අමුද්‍රව්‍ය | 5 000 | 9 000 |
| කෙරීගෙන යන වැඩ | 21 000 | 20 000 |
| නිමි තොග | 14 000 | ? |
| කර්මාන්තශාලා උපකරණ (ශුද්ධ) | 9 500 | 8 300 |

1998 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල අනෙක් ශේෂයන්

| | |
|---|---|
| අමුද්‍රව්‍ය ගැනුම් | 160 000 |
| විකුණුම් | 368 000 |
| නිෂ්පාදන වේතන | 60 000 |
| නිෂ්පාදන පොදුකාර්ය (ක්ෂය වීම් හැර) | 50 000 |
| කර්මාන්තශාලා උපකරණ ගැනුම් | 1 800 |

1998 ජනවාරි 01 දිනට තොගයේ තිබූ ගඩොල් ප්‍රමාණය ඒකක 5 000 කි. 1998 වර්ෂය තුළ දී නිෂ්පාදනය කළ ගඩොල් ප්‍රමාණය ඒකක 900 000 ක් වූ අතර ඒකක 920 000 ක් විකුණා ඇත.

ඔබ විසින්,

1 1998 වර්ෂය සඳහා නිෂ්පාදන ගිණුම පිළියෙල කරන්න.

2 මුළු නිෂ්පාදන පිරිවැය මත පදනම්ව 1998 වර්ෂය අවසාන නිමි තොගයේ අගය ගණනය කරන්න.

3 1998 වර්ෂය සඳහා වෙළඳ ගිණුම පිළියෙල කරන්න.

4 ප්‍රාථමික පිරිවැය මත පදනම්ව නිමි තොගය අගය කිරීමට ඔබ එකඟ වන්නේ ද නැද්ද යන්න සඳහන් කරන්න. හේතු දක්වන්න.

5 නිෂ්පාදන ගිණුමක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවයන් කෙටියෙන් පැහැදිලි කරන්න.

**Advanced Level 2000**

ඇඟලුම් නිපදවන සමන්ගේ ව්‍යාපාරයේ 2000 මාර්තු මාසයට අදාළව පහත තොරතුරු ලබා දී ඇත.

| | | රු. |
|---|---|---|
| 2000/03/01 දිනට තොග | | |
| | රෙදි (මීටර් 200) | 20 000 |
| | නිමි ඇඟලුම් (ඒකක 100) | 17 000 |
| මාර්තු මාසය තුළ සිදු වූ අනෙකුත් ගනුදෙනු | | |
| රෙදි මිලට ගැනුම් (මීටර් 3 000) | | 360 000 |
| සෘජු වැටුප් | | 98 000 |
| කළමනාකරණ වේතන | | 18 000 |
| ගෙන ඒමේ කුලී | | 4 000 |
| යන්ත්‍ර ක්ෂය | | 5 000 |
| 2000/03/31 ට ඉතිරි තොගය | | |
| | රෙදි (මීටර් 300) | 36 000 |
| | නිමි ඇඟලුම් (ඒකක 400) | ? |

අවසාන නිමි ඇඟලුම් තොගය සමන්විත වනුයේ මාර්තු මාසය තුල නිෂ්පාදනය කළ ඒකක වලින් පමණි. මාර්තු මාසය තුලදී මිලට ගත් රෙදි මීටර් 200 ක් නැති විය. මෙය ගිණුම්ගත කර නැත. නිමි ඇඟලුම් ඒකකයක් නිෂ්පාදනය සඳහා රෙදි මීටරයක් අවශ්‍ය වේ.

**2000 මාර්තු මාසය සඳහා පහත දේ ගණනය කරන්න.**

1 පාවිච්චි කළ රෙදි වල පිරිවැය
2 ප්‍රාථමික පිරිවැය
3 මුළු නිෂ්පාදන පිරිවැය
4 මුළු නිශ්පාදන පිරිවැය මත අගය කළ අවසාන ඇඟලුම් තොගයේ අගය

## Advanced Level 2002

නිමි ඇඳුම් නිෂ්පාදන ආයතනයක් වූ අලංකාර සමාගමේ පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත.

| | | රු. |
|---|---|---|
| 2001 ජනවාරි 01 දිනට ශේෂයන් | | |
| | රෙදි තොග | 180 000 |
| | නිමි තොග (කම්හල්) | 200 000 |
| | නොනිමි තොග | 140 000 |

| 2001 වර්ෂය තුළ සිදු වූ ගනුදෙනු | රු. |
|---|---|
| මිලට ගත් රෙදි | 250 000 |
| කම්හලට නිකුත් කළ රෙදි | 350 000 |
| සෘජු වැටුප් | 200 000 |
| කම්හල් ගොඩනැගිලි ක්ෂය | 240 000 |
| යන්ත්‍ර අලුත්වැඩියාව | 120 000 |
| කම්හල් පරිපාලන වියදම් | 220 000 |
| වෙළෙඳ අංශයට මාරු කළ නිමි ඇඳුම් තොගය | 750 000 |
| 2001 දෙසැම්බර් 31 දිනෙන් ශේෂයන් | |
| රෙදි තොග | ? |
| නිමි තොග (කම්හලේ) | ? |
| නොනිමි තොග | 130 000 |

කම්කරු ආරවුලක් නිසා 2001 දෙසැම්බර් 31 දින කම්හලේ උතුරු තිබූ තොගයේ රු. 25 000 වටිනා නිමි ඇඳුම් තොගයක් විනාශ වූ අතර එය වර්ෂයේ ලාභලාභ ගිණුමෙන් කපා හැරීමට තීරණය කරන ලදි.

මෙම ව්‍යාපාරය වර්ෂයක් තුළ නිපද වූ තොග සම්පූර්ණයෙන්ම වෙළෙඳ අංශයට මාරු නොකෙරේ. එම නිසා කම්හලේ ඉතිරිවන නිමි තොග නිෂ්පාදන ගිණුම තුළ ගලපනු ලැබේ.

අවශ්‍ය වන්නේ,

1 2001 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ගිණුම

2 තොග අලාභ සටහන් කිරීම සඳහා ජ'ර්නල් සටහන්

**Advanced Level 2003**

2002 ජනවාරි 01 දින මොරටු සමාගම ව්‍යාපාරික කටයුතු ආරම්භ කරන ලදි. සමාගම නිශ්චිත වර්ගයක අල්මාරි නිෂ්පාදනය කරයි. එහි නිෂ්පාදන සේවක මණ්ඩලය යන්ත්‍ර ක්‍රියාකරවන්නකුගෙන් හා වඩු කාර්මිකයකුගෙන් සමන්විතය. අල්මාරි සෑදීමේ දී එක් එක් සේවකයාගේ කාර්යය අවසන් වූ පසු ඔහුට ගෙවීම් සිදු කරන අතර එක් අල්මාරියක කාර්යය සඳහා යන්ත්‍ර ක්‍රියාකරුට රු. 600 ක් ද වඩු කාර්මිකයාට රු. 1 000 ක් ද ගෙවනු ලැබේ. 2002 දෙසැම්බර් 31 දිනට මොරටු සමාගමේ පොත්වලින් පහත සඳහන් ශේෂ උපුටාගන්නා ලදි.

| | රු. |
|---|---|
| යන්ත්‍ර උපකරණ පිරිවැයට | 750 000 |
| ලී මිලදී ගැනීම් | 266 000 |
| යන්ත්‍ර ක්‍රියාකරුගේ වැටුප් | 66 000 |
| වඩු කාර්මිකයන්ගේ වැටුප් | 104 000 |
| කර්මාන්තශාලා මුරකරුගේ වැටුප් | 33 000 |
| පරිපාලන වියදම් | 105 000 |
| සරනේරු සහ අගුළු ගැනුම් | 48 000 |
| වැලි කඩදාසි ඇණ යනාදී වක්‍ර ද්‍රව්‍ය පිරිවැය | 5 400 |
| ගොඩනැගිලි කුලිය (තුනෙන් එකක් පරිපාලනය සඳහා වේ) | 30 000 |
| යන්ත්‍ර සඳහා බලය | 4 500 |
| පාරිභෝගිකයන්ගේ නිවෙස් වෙත අල්මාරි ගෙන යාමේ වියදම් | 8 400 |
| යන්ත්‍ර නඩත්තු වියදම් | 3 600 |
| විකුණුම් | 600 000 |

**අමතර තොරතුරු**

1 අල්මාරියක් රු. 6 000 බැගින් අලෙවි කරයි.

2 එක් අල්මාරියක් සඳහා පිරිවැය රු. 450 ක් වූ සරනේරු සහ අගුළු අවශ්‍ය වේ.

3 2002 දෙසැම්බර් 31 දිනට සමාගම සතුව පාවිච්චි නොකල ලී පිරිවැයට රු. 46 000 ක් ද සම්පූර්ණ කළ අල්මාරි 4 ක් ද එසේම සම්පූර්ණ නොකල අල්මාරි 6 ක් ද තිබිණි. මෙම සම්පූර්ණ නොකළ අල්මාරි සඳහා මෙතෙක් දරා ඇත්තේ ලී පිරිවැය හා යන්ත්‍ර ක්‍රියාකරුගේ වැටුප පමණි.

4 යන්ත්‍ර හා උපකරණ වර්ෂයකට 5% බැගින් පිරිවැය මත ක්ෂය කළ යුතු ය.

**අවශ්‍ය වන්නේ,**

1 වර්ෂය තුළ සම්පූර්ණයෙන්ම නිම කරන ලද මුළු අල්මාරි ගණන

2 සම්පූර්ණ නොකළ අල්මාරියක පිරිවැය

3 2002 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මොරටු සමාගමේ නිෂ්පාදන ගිණුම

4 සම්පූර්ණ කළ අල්මාරියක පිරිවැය

**Advanced Level 2004**

රූපවාහිනී යන්ත්‍ර නිෂ්පාදනය කරන සමාගමක් වන සීමිත ලක්සෝ සමාගමේ 2004 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම් පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත.

| | |
|---|---|
| 2003/04/01 දිනට තොග | රු. |
| අමුද්‍රව්‍ය | 120 000 |
| නිමි තොග (ඒකක 60) | 276 000 |
| නොනිමි තොග | 35 000 |
| අමුද්‍රව්‍ය මිලදී ගැනුම් | 732 000 |
| සෘජු වේතන | |
| ගෙන ඒමේ කුලී | 5 000 |
| කර්මාන්තශාලා කුලී | 44 000 |
| විකුණුම් | 1 260 000 |
| කර්මාන්තශාලා විදුලි බලය | 62 000 |
| කර්මාන්තශාලා සුපරීක්ෂණය | 90 000 |
| වක්‍ර ද්‍රව්‍ය | 26 000 |
| යන්ත්‍ර සූත්‍ර ක්ෂය | 24 000 |

**අමතර තොරතුරු**

1 2004/03/31 දිනට තොග

අමුද්‍රව්‍ය රු. 90 000 නොනිමි ද්‍රව්‍ය රු. 46 000

2 වර්ෂය තුල දී රූපවාහිනී යන්ත්‍ර දෙකක් සොරා ගෙන ඇති අතර රු. 12 000 ක් වටිනා අමුද්‍රව්‍ය ගින්නෙන් විනාශ වී ඇත. මේ සම්බන්ධ කිසිවක් පොත්වල සටහන් කර නොමැත.

3 2004/03/31 දිනට රූපවාහිනී යන්ත්‍ර 78 ක් කම්හල තුළ තිබුණි.වර්ෂය තුළ රූපවාහිනී යන්ත්‍ර 180 ක් විකුණා ඇති අතර මේ තුළ ආරම්භක නිමි තොගය වූ රූපවාහිනී යන්ත්‍ර 60 ඇතුළත් වේ.

**අවශ්‍ය වන්නේ**

පහත සඳහන් තොරතුරු පැහැදිලිව පෙන්නුම් කරමින් 2004 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන සහ වෙළෙඳ ගිණුම පිළියෙල කරන්න.

- පරිභෝජනය කළ අමුද්‍රව්‍ය පිරිවැය
- ප්‍රාථමික පිරිවැය

- මුළු නිෂ්පාදන පිරිවැය
- මුළු නිෂ්පාදන පිරිවැය මත පදනම් වූ අවසාන නිමි තොගයේ අගය
- විකුණුණු භාණ්ඩ පිරිවැය

**Advanced Level 2005**

සුනිල් ට්‍රේඩර්ස් හි ආධුනික ගිණුම් සහයක විසින් 2005/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද නිෂ්පාදන ගිණුම පහත දැක්වේ.

**නිෂ්පාදන ගිණුම**

| | | | |
|---|---|---|---|
| ආරම්භක අමුද්‍රව්‍ය | 26 500 | මුළු නිෂ්පාදන පිරිවැය | 510 000 |
| ආරම්භක නොනිමි තොගය | 32 100 | (නිෂ්පාදනය කළ ඒකක ගණන 5 000) | |
| ආරම්භක නිමි තොගය | 10 000 | | |
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | 162 000 | | |
| සෘජු වේතන | 231 000 | | |
| යන්ත්‍ර ක්ෂය | 36 000 | | |
| අනෙකුත් කම්හල් පිරිවැය | 10 900 | | |
| මෙවලම් | 1 500 | | |
| | 510 000 | | 510 000 |

2005/03/31 දිනට අවසාන තොග පහත දැක්වේ.

අමුද්‍රව්‍ය රු. 16 000 නොනිමි තොගය රු. 9 000 නිමි තොගය රු. 15 000

**අවශ්‍ය වන්නේ,**

1. පාවිච්චි කළ මුළු අමුද්‍රව්‍ය පිරිවැය ගණනය කිරීම
2. මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම
3. නිෂ්පාදන පිරිවැයෙන් 20% ක ලාභයක් ලැබෙන පරිදි භාණ්ඩ විකුණුවේ නම් ඒකකයක විකුණුම් මිල ගණනය කිරීම